# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2225/5 - 2021 අප්‍රේල් මස 27 වැනි අඟහරුවාදා - 2021.04.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

**6 වන සංශෝධනය**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාව

අංක 1695/15 හා 2011 මාර්තු 01 දිනැති, අංක 1865/36 හා 2014 ජුනි 06 දිනැති, 1981/99 හා 2016 අගෝස්තු 27 දිනැති, අංක 2070/7 හා 2018 මැයි 09 දිනැති, අංක 2137/66 හා 2019 අගෝස්තු 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍ර මඟින් සංශෝධිත අංක 1670/33 හා 2010 සැප්තැම්බර් 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

එම්.ඒ.බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 මාර්තු මස 22 වැනි දින.

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

(ii) ශ්‍රී ලංකා කාර්මික විද්‍යාලයේ/ශ්‍රී ලංකා උසස් කාර්මික අධ්‍යාපන ආයතනයේ /ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උසස් ඩිප්ලෝමාලාභියෙකු හෝ උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාලාභියෙකු විය යුතුය ;

(iii) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ වෙනත් යම් පොදු රාජ්‍ය මණ්ඩලයීය රටක වරලත් ගණකාධිකාරී ආයතනයක ආවසරික II හෝ අන්තර් මාධ්‍ය පරීක්ෂණය හෝ ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය II හෝ ව්‍යාපාර අදියර විභාගය හෝ ව්‍යාපාර අදියර II විභාගය හෝ ඊට වඩා ඉහළ පරීක්ෂණයකින් හෝ සමත්වී සිටිය යුතුය;

(viii) ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ කළමනාකරණ මට්ටම හෝ ඊට වඩා ඉහළ මට්ටමක පරීක්ෂණයකින් සමත්වී සිටිය යුතුය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7.2.2.5 වෙනත්: (III) වගන්තිය ඉවත් කරනු ලැබේ. අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

7.2.4.1 ලිඛිත විභාගය: විවෘත ධාරාව යටතේ බඳවා ගැනීමට අදාළ ලිඛිත විභාගය හා සම්බන්ධ කරුණු 1 වැනි පරිශිෂ්ඨයේ දැක්වේ.

(7.2.4.1 යටතේ දැනට පවතින වගුව ඉවත් කරනු ලැබේ.)

7.3.2.5 වෙනත් :

(III) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

*සටහන*:

අංක 1670/33 හා 2010.09.10 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවේ ඉංග්‍රීසි භාෂා පරිවර්තනයෙහි, වගන්ති අංක 7.3.2.6, 7.3.3 ලෙසත් 7.3.2.7, 7.3.3.1 ලෙසත් සංශෝධනය වේ.

7.3.3.1 ලිඛිත විභාගය: සීමිත ධාරාව යටතේ බඳවා ගැනීමට අදාළ ලිඛිත විභාගය හා සම්බන්ධ කරුණු 1 වැනි පරිශිෂ්ඨයේ දැක්වේ.

(7.3.3.1 යටතේ දැනට පවතින වගුව ඉවත් කරනු ලැබේ.)

7.2.4.4.1, 7.3.3.4.1 හා 7.4.3.3.1 හි සඳහන් වගන්තියට පහළින් පහත සටහන ඇතුලත් කරනු ලැබේ.

*සටහන*: මෙම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන රාජ්‍ය නිලධාරීන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ.

10.1. III වැනි ශ්‍රේණියේ සිට II වැනි ශ්‍රේණියට උසස් කිරීම

10.1.1.1. සපුරාලිය යුතු අවශ්‍යතා

(v) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

10.2. II වැනි ශ්‍රේණියේ සිට I වැනි ශ්‍රේණියට උසස් කිරීම

10.2.1.1. සපුරාලිය යුතු අවශ්‍යතා

(iii) උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

15. සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේදී යම් වර්ෂයකදී බඳවාගත යුතු සංඛ්‍යාව වනුයේ පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව වේ.

දැනට පවතින 1 වැනි පරිශිෂ්ඨය වෙනුවට මෙහි පහත දැක්වෙන 1 වැනි පරිශිෂ්ඨය ආදේශ කරනු ලැබේ.

## 1 වැනි පරිශිෂ්ඨය

### ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ බඳවා ගැනීම් සඳහා පවත්වනු ලබන විවෘත/සීමිත තරඟ විභාග පිළිබඳ විස්තර:

**විභාග පටිපාටිය සහ විෂයය නිර්දේශයන්:-**

රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වන පොදු තරඟ විභාගය මේ සඳහා අදාළ වේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලැබේ. එම තරඟ විභාගයේ පළමු කොටසේ (පොදු කොටස) එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් 40% වැඩි සහ මුළු ලකුණු ප්‍රමාණය 100 ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගන්නා අයදුම්කරුවන් පමණක් ඉහත විභාගයේ දෙවන කොටස සඳහා කැඳවනු ලැබේ.

(අ) රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වන පොදු තරඟ විභාගයේ පළමු කොටස (පොදු කොටස)

(I) සාරාංශය

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 1 ½ | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. සමත් ලකුණ 40 |
| අවබෝධය | පැය 02 | ලකුණු 100, බහුවරණ ප්‍රශ්න සහ / හෝ කෙටි ප්‍රශ්න වලින් සමන්විත වේ. සමත් ලකුණ 40 |

(II) විෂය නිර්දේශය

| බුද්ධි පරීක්ෂණය |
|---|
| අපේක්ෂකයා සතු තර්කනය, ආදේශනය, අර්ථකථනය, සම්බන්ධතා දැකීම, පරිවර්තනය, ගැටලු විසඳීමේ හැකියාව, හේතුඵල සම්බන්ධතා අවබෝධ කර ගැනීම, පුරෝකථනය, තොරතුරු සංවිධානය, රටා හඳුනා ගැනීම සහ උපදෙස් පිළිපැදීම ආදී හැකියා මැනීම සඳහා සකස් කරනු ලබන බහුවරණ වර්ගයේ ප්‍රශ්නවලින් යුක්ත වේ. |
| අවබෝධය |
| අපේක්ෂකයා සතු කරුණු අවබෝධ කර ගැනීමේ හැකියාව, සන්නිවේදන කුසලතා, සාරාංශකරණය, විවරණය හා නිර්මාණාත්මක බව ආදී කුසලතා මැනීම සඳහා සකස් කරනු ලබන වාස්තවික ප්‍රශ්නවලින් යුක්ත වේ. |

(ආ) රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා වන පොදු තරග විභාගයේ දෙවන කොටස (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමට අදාළ විශේෂිත කොටස)

(I) සාරාංශය

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය* |
|---|---|---|
| මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය | පැය 03 | ලකුණු 100, සමත් ලකුණ 40 යි.<br>(ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ)<br>( I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි<br>II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි) |
| උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය | පැය 03 | ලකුණු 100, සමත් ලකුණ 40 යි.<br>(ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් සමන්විත වේ)<br>( I කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 60 කි<br>II කොටස සඳහා වන ලකුණු ප්‍රමාණය 40 කි) |

(II) විෂය නිර්දේශය

**මූල්‍ය හා කළමනාකරණ ගිණුම්කරණය**
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුක්ත වන අතර ප්‍රශ්න 08 කින් සමන්විත වේ)

**I කොටස - මූල්‍ය ගණකාධිකරණය**

මෙම කොටස ප්‍රශ්න පහකින් (05) සමන්විත වේ. පළමු වන ප්‍රශ්නය අනිවාර්යය වන අතර ඉතිරි ප්‍රශ්න හතරෙන් (04) දෙකක් (02) තෝරාගත යුතු ය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1.අනිවාර්යය ප්‍රශ්නය :

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල භාවිතය පිළිබඳ අපේක්ෂකයා සතු හැකියාව මැන බැලීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කෙරේ. මෙම ප්‍රශ්නයට අනු කොටස් පහක් ඇති අතර සෑම කොටසකටම ලකුණු 04 ක් හිමිවේ.

මෙම ප්‍රශ්නය යටතේ පහත දැක්වෙන ශ්‍රී.ලං.ගි.ප්‍රමිත ආවරණය කරනු ලැබේ.

- මූල්‍ය ප්‍රකාශන - ශ්‍රී.ලං.ගි.ප්‍ර.1
- දේපල, පිරියත හා උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.16
- අයභාරය–ශ්‍රී.ලං.ගි.ප්‍ර. 18
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය - ශ්‍රී.ලං.ගි.ප්‍ර. – 7
- තොග - ශ්‍රී.ලං.ගි.ප්‍ර.2
- ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් හා වැරදි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.8
- වාර්තාකරණ කාලපරිච්ඡේදයෙන් පසු සිද්ධි - ශ්‍රී.ලං.ගි.ප්‍ර.10
- කල්බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර.17
- ආදායම් බදු - ශ්‍රී.ලං.ගි.ප්‍ර12
- ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් හා අසම්භාව්‍ය වගකීම් - ශ්‍රී.ලං.ගි.ප්‍ර.37
- මූල්‍ය උපකරණ - ශ්‍රී.ලං.ගි.ප්‍ර.39

2. මූල්‍ය ප්‍රකාශ සඳහා සංකල්පමය හා නියාමන ආකෘති රාමුව

පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශවල අරමුණු, යොදාගන්නා වූ උපකල්පන, මූල්‍ය ප්‍රකාශවල ගුණාත්මක ලක්ෂණ, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග, මූල්‍ය ප්‍රකාශවල මූලිකාංග හඳුනාගැනීම හා මිනුම් කිරීම, ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නඩත්තු කිරීමේ සංකල්ප, ආයතනික පාලනයට අදාළ විධිවිධාන, සමාගම් පනත සහ සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ රෙගුලාසි හා නීති

3. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඇතුළු සීමිත වගකීම් සමාගම් වල මූල්‍ය ප්‍රකාශ

වගකීමෙන් සීමිත සමාගමක් සඳහා ඇති අරමුදල් මූලාශ්‍ර හඳුනාගැනීම, කොටස් හා ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම සඳහා ලෙජර් ගිණුම් පිළියෙල කිරීම, කළමණාකාරීත්වයේ කාර්යයන් සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා පළ කිරීම.

4. ලාභ නොලබන සංවිධාන සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම

5. මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය, මූල්‍ය ප්‍රතිඵල අර්ථනිරූපණය හා සන්නිවේදනය කිරීම හා මූල්‍ය
නොවන වාර්තාකරණය

**<u>II කොටස - කළමනාකරණ ගණකාධිකරණය</u>**

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස්කරන ලද ප්‍රශ්න 03 කින් සමන්විත වන අතර ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. පිරිවැය ගිණුම්කරණයේ අංග
   පිරිවැය වර්ගීකරණය, පිරිවැය හැසිරීම, ඇස්තමේන්තුගත කිරීම, ද්‍රව්‍ය හා තොග පාලනය , ශ්‍රම පිරිවැය, නිශ්චිත හා අඛණ්ඩ ඇණවුම් පිරිවැය
2. පිරිවැය ගිණුම්කරණ ක්‍රම
   අන්තර්ග්‍රහණ පිරිවැයකරණය හා ආන්තික පිරිවැයකරණය, ක්‍රියාකාරකම් පාදක පිරිවැයකරණය, ක්‍රියාවලි පිරිවැයකරණය, ප්‍රතිදාන ගිණුම්කරණය, නූතන කළමනාකරණ ගිණුම්කරණය
3. ව්‍යාපාර සඳහා මූල්‍ය ගණිතය හා ව්‍යාපෘති ඇගයීම් මූලිකාංග
   සංයෝග, වට්ටම් කිරීම
4. ප්‍රමිත පිරිවැයකරණය හා විචලතා විශ්ලේෂණය
5. ව්‍යාපාර කටයුතු සඳහා ගණිතය
6. අයවැයකරණය හා පුරෝකථනය අයවැයකරණය, අයවැය පිළියෙල කිරීම හා අයවැය පාලනය කිරීම
7. අවිනිශ්චිතතාවය යටතේ තීරණ ගැනීම කෙටිකාලීන හා දිගුකාලීන තීරණ ගැනීම සඳහා වන තොරතුරු, පිරිවැය - පරිමා - ලාභ විශ්ලේෂණය, වැඩිදුර විස්තීර්ණ සැකසීම් මිලකරණය, බහුවිධ අවහිරතා යටතේ තීරණ ගැනීම
8. කාරක ප්‍රාග්ධන කළමනාකරණය

**උසස් විගණනය හා ආර්ථික විශ්ලේෂණය**
(මෙම ප්‍රශ්න පත්‍රය කොටස් 02 කින් යුතු අතර, ප්‍රශ්න 08 කින් සමන්විත වේ.)

**<u>I කොටස - උසස් විගණනය</u>**

මෙම කොටස පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 05 කින් සමන්විත වන අතර ප්‍රශ්න 03 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. විවිධ විගණන විධි හා එම විගණනයන් වල අරමුණු
   මූල්‍ය විගණනය, පද්ධති විගණනය, අනුකූලතා විගණනය, මුදලට අගය විගණනය, කාර්යසාධන විගණනය, ව්‍යෝහාරික විගණනය, අභ්‍යන්තර විගණනය, බාහිර විගණනය, කළමනාකරණ විගණනය යනාදිය
2. විගණන සැලසුම්කරණය හා පාලනය
   විගණන සැලසුම්කරණය, කාල නිශ්චය, අන්තර් හා අවසන් විගණනය, කාර්යයන් සඳහා වගකීම් පැවරීම, අභ්‍යන්තර පාලනයේ භාවිතය ඇතුළු සිදුකරන ලද කටයුතු වාර්තා කිරීම, අභ්‍යන්තර පාලනය ඇගයීම සඳහා ප්‍රශ්නාවලි හා ආකෘති පත්‍ර පිළියෙල කිරීම.
3. වෘත්තීමය හැසිරීම හා ආචාර ධර්ම
   අවංක බව, ඒකරාශී වීමේදී දක්වන විෂය මූලිකභාවය, විගණන කටයුතු පිළිබඳ තොරතුරු ඇගයීම හා තොරතුරු සන්නිවේදනය කිරීම, තොරතුරුවල රහසිගතභාවය, වෘත්තීමය බැඳියාව, දැනුම, කුසලතා හා පළපුරුද්ද යොදා ගැනීමේ දක්ෂතාවය

4. නෛතික අයිතිය හා වගකීම්
ගණකාධිකාරීවරුන්ගේ හා විගණකවරුන්ගේ නීතිමය වගකීම් හා අදාළ නීතිමය විධිවිධාන

5. අවදානම් තක්සේරු කිරීමේ ශිල්පක්‍රම හා කළමනාකරණය
විවිධ අවදානම් වර්ග, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ශිල්ප ක්‍රම හා උපකරණ හඳුනා ගැනීම

6. විගණන ප්‍රමිතීන්
අන්තර්ජාතික විගණන ප්‍රමිති (ISAs) හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs)

7. අභ්‍යන්තර විගණනයේ කාර්යයන්
අභ්‍යන්තර විගණනයේ කාර්යයන් හා අභ්‍යන්තර විගණනයේ අරමුණු හඳුනාගැනීම, විගණන කමිටු

8. සාක්ෂි රැස්කිරීම
සාක්ෂි එකතු කිරීමේ විවිධ ක්‍රම හා සාක්ෂි එකතු කිරීමේ ක්‍රියාවලි හඳුනාගැනීම, සාක්ෂි වල වලංගුභාවය සහතික කිරීම

9. වාර්තාකරණ කාර්යයන්
වාර්තා වර්ග, වාර්තාකරණ ප්‍රමිතීන්, ව්‍යුහයන්, වාර්තා කිරීමේ ක්‍රියාවලිය, විගණන මත හා පසු විපරම් ක්‍රියාවලි යනාදිය.

**<u>II කොටස - ආර්ථික විශ්ලේෂණය</u>**

පහත කරුණු ආශ්‍රයෙන් සකස් කරන ලද ප්‍රශ්න 03 කින් මෙම කොටස සමන්විත වන අතර ඉන් ප්‍රශ්න 02 කට පිළිතුරු සැපයිය යුතුය. සෑම ප්‍රශ්නයක් සඳහාම සමාන ලකුණු ප්‍රමාණයක් හිමිවේ.

1. සාර්ව ආර්ථික විචල්‍යයන් අවබෝධ කර ගැනීම
සාර්ව ආර්ථික විචල්‍යයන් හා ප්‍රධාන දර්ශක, සාර්ව ආර්ථික විචල්‍යයන් තක්සේරු කිරීමේ අරමුණ, සාර්ව ආර්ථික විචල්‍යයන් අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතා සහ ශ්‍රී ලංකාවේ වර්තමාන සන්දර්භය හඳුනාගැනීම.

2. ජාතික ආදායම් නිශ්චය කිරීම හා ජාතික ආදායම් ගිණුම්කරණය
ජාතික ආදායම් මැනීමේ ක්‍රම, ජාතික ආදායමේ ආංශික දායකත්වය, ප්‍රාග්ධන පරිභෝජනය සහ ප්‍රාග්ධන පරිභෝජන ගැළපුම්, රාජ්‍ය පරිභෝජනය සහ පෞද්ගලික පරිභෝජනය, ජාතික නිෂ්පාදන හා සුභසාධනය සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

3. අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය
අන්තර්ජාතික වෙළඳ න්‍යාය, අන්තර්ජාතික වෙළඳාම හා ආර්ථික සංවර්ධනය, ගෙවීම් හා විනිමය අනුපාතයේ හැසිරීම තුලනය කිරීම සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

4. විදේශ මූල්‍ය, විදේශ සෘජු ආයෝජන, සංවර්ධනය වන රටවල ණය, තිරසර ණය කළමනාකරණය සහ වර්තමාන ශ්‍රී ලංකා සන්දර්භය

5. ප්‍රාග්ධන හා මූල්‍ය වෙළඳපොල, මූල්‍ය අතරමැදියන් හා මූල්‍ය උපකරණ

6. මුදල් ප්‍රතිපත්තිය

7. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

02. විභාග මාධ්‍යය

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකිය.

(iii) අපේක්ෂකයින් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුතු අතර ඒ සඳහා එක් භාෂා මාධ්‍යයක් පමණක් තෝරා ගත යුතුය.

(iv) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

03. පත් කරනු ලැබීම සඳහා තෝරා ගැනීමේ ක්‍රමය:

සෑම ලිඛිත ප්‍රශ්න පත්‍රයක් සඳහාම නියමිත ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% ක් හෝ ඊට වැඩි ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර සම්මුඛ පරීක්ෂණයේ දී සුදුසුකම් සනාථ කළ අයදුම්කරුවන්, ලිඛිත විභාගයේ දී ලබා ඇති ලකුණු කුසලතා අනුපිළිවෙල සහ රජයේ විධායක නිලධර ගණයේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා පවත්වනු ලබන පොදු තරග විභාගයට අයදුම්කරනු ලබන අවස්ථාවේ සටහන් කරනු ලබන සේවා මනාපය අනුව පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

05-107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.